ස්ත්‍රී පුරුෂ භේදය සලකමින් -විශේෂයෙන්ම කාන්තාවන්ව- කොන් කිරීමකට ලක් කරනා, වෙනස් ලෙසින් සැලකුම් කෙරෙනා ආකාරයේ වාර්තාකරණයන් ඇතැම් විට මාධ්‍ය තුළ දක්නට ලැබේ. එහි එක් ආකාරයක් වන්නේ, පුද්ගල කණ්ඩායමක් විසින් යම් කිසි වරදක් සිදුකළැයි වාර්තා කෙරෙන විටදී, එම කණ්ඩායමේ සිටිනා කාන්තාවන්ව විශේෂයෙන් ඉස්මතු කරමින් පුවත් ලිවීමයි. මෙයින් ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයම විසින් එකම ආකාරයේ වරදක් කරන ලදැයි සැලකෙන අවස්ථාවකදී පවා, කාන්තාව කළ වරදට වැඩි බරක් යොදා දැක්වීම සිදුනොවේදැයි අප විමසිය යුතුවේ.

මෙයට උදාහරණ ලෙසින් එකම පුවතක් සිලෝන් ටුඩේ, අරුණ සහ ඩේලිමිරර් පුවත්පත් තුළ වාර්තා වී ඇති ආකාරය (01/19) ගත හැක. මෙහිදී සිලෝන් ටුඩේ තුළ "52 arrested at a rave..." යනුවෙන්ද, අරුණ තුළ "...මත් සාදයක් පැවැත්වූ තරුණ තරුණියෝ 52 ක් දැලේ" යනුවෙන්ද වඩා නිවැරදි ලෙසින් දක්වා තිබිණි. කෙසේ නමුත් ඩේලිමිරර් තුළ මේ පිළිබඳව සඳහන්ව තිබුණේ "54 persons including 13 girls arrested..." යනුවෙනි. මෙම ඩේලි මිරර් පුවත තුළ ඉස්මතු වී ඇත්තේ කාන්තාව පමණි. එය ස්ත්‍රී පුරුෂ භාවය පදනම් කරගනිමින් කාන්තාව ඍජුව කොන් කිරීමක් නොවේද? මේ සම්බන්ධයෙන් ඔබේ අදහස කුමක්ද?

#MediaEthicsSL #lka #SinhalaPress #EnglishPress #CeylonToday #DailyMirror #Aruna